# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 25 දරන
# ශ්‍රී ලංකා දේහ ධම්ම
# (දිව්‍යමය ශාරීරික සුව පිළිවෙත්)
# මධ්‍යස්ථානය
# (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 අප්‍රේල් මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 අප්‍රේල් මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 25 දරන ශ්‍රී ලංකා දේහ ධම්ම (දිව්‍යමය ශාරීරික සුව පිළිවෙත්) මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 අප්‍රේල් මස 21 වන දින]

**එල්. ඩී.—ඕ. 8/90**

**ශ්‍රී ලංකා දේහ ධම්ම (දිව්‍යමය ශාරීරික සුව පිළිවෙත්) මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

***පූර්විකාව.***

"ශ්‍රී ලංකා දේහ ධම්ම (දිව්‍යමය ශාරීරික සුව පිළිවෙත්) මධ්‍යස්ථානය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන මධ්‍යස්ථානයක් එකී මධ්‍යස්ථානයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීති අනුව එකී මධ්‍යස්ථානයට අදාළ සියළු පරමාර්ථ සහ කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටුකර ගෙන යාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ කොළඹ 8, ගෝතමී පාරේ අංක 99/2 හි මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

**එකී මධ්‍යස්ථානය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු එකී මධ්‍යස්ථානය විසින් මේ දක්වා සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද :**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

***ලුහුඬු නාමය.***

**1.** මේ පනත 1992 අංක 25 දරන ශ්‍රී ලංකා දේහ ධම්ම (දිව්‍යමය ශාරීරික සුව පිළිවෙත්) මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

***ශ්‍රී ලංකාවේ දේහ ධම්ම (දිව්‍යමය ශාරීරික සුව පිළිවෙත්) මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම.***

**2.** මේ පනත ක්‍රියාත්මක වන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "මධ්‍යස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා දේහ ධම්ම (දිව්‍යමය ශාරීරික සුව පිළිවෙත්) මධ්‍යස්ථානයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කෙරෙන (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කෙරෙන) සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන් "ශ්‍රී ලංකා දේහ ධම්ම (දිව්‍යමය ශාරීරික සුව පිළිවෙත්) මධ්‍යස්ථානය" යන නාමය සහ අභිධානය යටතේ අඛණ්ඩ පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ හා සංස්ථාවේ අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය. තවද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියළු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි ය.

***සංස්ථාවේ පොදු පරමාර්ථ.***

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) අමෙරිකා එක්සත් ජනපදයේ කැලිෆෝර්නියාවේ රාජ්‍ය ලේකම් වෙත ලාභ නොලබන සංස්ථාවක් ලෙස 1152765 අංකයෙන් ලියාපදිංචි කරනු ලැබූ ලොස් ඇන්ජලීස් හි පිහිටුවා ඇති රාවණ රජුගේ දේහ ධම්ම (දිව්‍යමය ශාරීරික සුව පිළිවෙත්) මධ්‍යස්ථානය හා අනුබද්ධ දේහ ධම්ම (දිව්‍යමය ශාරීරික සුව පිළිවෙත්) මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ පිහිටුවා ශාරීරික හා මානසික ඌනතාවයන්ගෙන් පෙළෙන

මනුෂ්‍යයන් ආරක්ෂා කිරීම, රැක බලාගැනීම, ඔවුන්ට ප්‍රතිකාර කිරීම, අධ්‍යාපනය ලබාදීම හා පුනරුත්ථාපනය කිරීම නංවාලීම ;

(ආ) සෞඛ්‍යයෙන්, ධනයෙන්, ආහාරවලින්, ඇඳුම් පැළඳුම්වලින් සහ ප්‍රචණ්ඩ ක්‍රියාවලින් තොරව සමගි ලෙස ජීවත් වීමෙන් ස්වයංපෝෂිතභාවය ළඟාකර ගැනීම සඳහා ක්‍රම පුරුදු කිරීමෙන් ශ්‍රී ලංකාවේ රාවණ රජුගේ ස්වර්ණමය යුගය පුනර් ජීවනය කිරීම ;

(ඇ) මහජනයාගේ යහපත පිණිස දේහ ධම්ම මගින් ජීවත්වීමේ බෞද්ධ මූල ධර්ම ඉගැන්වීම ;

(ඈ) රාවණ රජුගේ පැලෑටි ඖෂධීය පිළියම්වල ආනුභාවය පිළිබඳ පර්යේෂණ ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම ;

(ඉ) දේහ ධම්ම (දිව්‍යමය ශාරීරික සුව පිළිවෙත්) නගා සිටුවීම සඳහා දේශනා, සම්මන්ත්‍රණ සහ අනෙකුත් අධ්‍යාපනික වැඩ සටහන් පැවැත්වීම සහ තොරතුරු හා අධ්‍යාපනික කරුණු පළ කිරීම ;

(ඊ) මනුෂ්‍ය සංහතියේ සංස්කෘතිය, අධ්‍යාපනය සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ස්වභාව ධර්මය යොදා ගැනීම සහ අවනත කර ගැනීම ;

(උ) චිකිත්සාව සහ පිටරට යැවීම පිණිස ඖෂධ පැලෑටි වගා කිරීමට මහජනයා දිරිගැන්වීම ; සහ

(ඌ) ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම පිණිස හිතකර හෝ ආනුෂංගික වෙනත් සියළු ක්‍රියා සහ දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේදී ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේදී ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේදී ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේදී සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කර ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය සේවක පිරිස් සේවයට බඳවා ගැනීමේ, නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේදී බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේදී කරුණු ඉටු කිරීමේ ද දේවල් ක්‍රියාවේ යෙදවීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ නිලධරයන්ගෙන් සහ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සෙසු තැනැත්තන්ගෙන් සමන්විත වූ පාලක මණ්ඩලයක් විසින්, සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට යටත්ව, පරිපාලනය කළ යුතු ය.

(2) මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ මධ්‍යස්ථානයේ ධුර දැරූ ද මෙම පනතේ උපලේඛනයේ නම් සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වූ ද පාලක මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම පාලක මණ්ඩලය වන්නේ ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, අස්වීම හෝ අස් කිරීම සඳහා ද සංස්ථාවේ පාලක මණ්ඩලයේ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ හා සේවකයන්ගේ කාර්යය ඉටු කිරීම සඳහා ද නිලධරයන් තෝරා පත් කර ගැනීම සඳහා ද සංස්ථාවේ කටයුතු කර ගෙන යාමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහාද සංස්ථාව විසින් කලින් කල මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නො අඩු ඡන්දයෙන්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන, රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා හෝ මින් පසු සම්මත කරනු ලබන හෝ කිසිම රීතියක් සංස්ථාවේ මහා සභා රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් විනා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම නොකරනු ලැබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී මධ්‍යස්ථානයේ බල පැවැත් වූ රීති, පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ පනත යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියළුම සාමාජිකයන් තත් කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

මධ්‍යස්ථානය විසින් ගෙවිය යුතු සහ මධ්‍යස්ථානයට අය විය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පවත්නා වූ මධ්‍යස්ථානයේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර එදිනට මධ්‍යස්ථානයට අය විය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් සහ සාමාජික මුදල් සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව වෙත පැවරෙන යම් නිශ්චල හෝ චංචල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එවැනි සියලු දේපළ මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ එවකට බලපවත්නා රීතිවලට යටත්ව, ඒ දේපළ උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව, සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේ ද යන වග.

**9.** සංස්ථාවේ පාලක මණ්ඩලයේ සාමාජිකයන් තුන්දෙනෙකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු ය. ඒ සාමාජිකයන් විසින් තමන් පැමිණ සිටිය බවට සළකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තවද එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11.** මේ පනතෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

### උපලේඛනය

[5 (2) වන වගන්තිය]

අති පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රීය ස්ථවිරයන්වහන්සේ

වෛද්‍යාචාර්ය ජේ. ජේ. ජූලියන් මහතා, එම්. .ඩී. හොලිවුඩ්, ඇ. එ. ජ.

දූ. බි. විජේකෝන් මහතා, පා. ම., රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

දොන් තෙරේ මුදලිහාමි වර්ණසූරිය.

ඒ. එම්. බී. වැලිගෙපොල මහතා, රත්නපුර හිටපු මහා දිසාපති

නිමල් වර්ණසූරිය මහතා.

සාම විනිසුරු සූ. බී. අලව්ව මහතා

ගාමිණී වර්ණසූරිය මහතා

සී. පරණවිතාන මහතා

රන්ජිත් වර්ණසූරිය මහතා

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 579 කි. විදේශීය රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.